# ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමාගේ පණිවුඩය

මා හිතවත් ශ්‍රී ලාංකික සහෝදර සහෝදරියනි,

නමස්කාර්, ආයුබෝවන්, වණක්කම්!

78 වන ඉන්දීය නිදහස් දිනය නිමිත්තෙන් මාගේ සුබ පැතුම්! ඉන්දියාව මෙම නිදහස් දිනය සමරන්නේ නිදහස ලබා වසර සියයක් සපිරෙන 2047 වසර වන විට වික්සිත් භාරතයක් හෙවත් සංවර්ධිත රටක් බවට පරිවර්තනය වීමේ අධිෂ්ඨානය පෙරදැරිව ය.

පසුගිය වසරේදී 8% ඉක්මවූ වර්ධනයක් සනිටුහන් කළ ඉන්දියානු ආර්ථිකයේ වටිනාකම මේ වන විට ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 3.9 කි. එය ලොව පස් වෙනුවට විශාලතම ආර්ථිකය වන අතර ඉදිරි වසර පහ තුළ දී තෙවන විශාලතම ආර්ථිකය බවට පත් වනු ඇත. එසේම, මෙම ආර්ථික වර්ධනය ස්ථාපිත පුනර්ජනනීය බලශක්ති ධාරිතාවය අතින් ලොව සිව්වන විශාලතම රාජ්‍යය වන ඉන්දියාවේ හරිත ඉලක්කයන්හි ප්‍රගතිය සමඟ ද එක් වී ඇත. ප්‍රජාතාන්ත්‍රික පාලන පද්ධතියක් තුළ සිදු වන බැවින් මෙම ඉහළ වර්ධනය සැබවින්ම දර්ශනීය වේ. කිසිවකු අත නොහරිමින් නිදහස් සහ සාධාරණ මැතිවරණ ක්‍රියාවලියක් තුළ වාර්තාගත ඡන්ද දායකයන් මිලියන 642ක් ඡන්දය ප්‍රකාශ කරන ඉන්දියානු මැතිවරණ ප්‍රජාතන්ත්‍රවාදයේ විශාලතම ජයග්‍රහණය ලෙස සැලකේ.

එලෙස ඉන්දියාව සෞභාග්‍යය කරා පියනැගීමට අපේක්ෂා කරන්නේ සිය සමීපතම සමුද්‍රීය අසල්වැසියා සහ සහකරුවා වන ශ්‍රී ලංකාව සමඟිනි. ආකර්ෂණීය ආර්ථික ප්‍රතිසාධනයක් ළඟා කරගත් ශ්‍රී ලංකාව ප්‍රතිසංස්කරණ, නැගී සිටීම සහ පිබිදීම සඳහා මාර්ගයට අවතීර්ණ වී සිටියි. විභව්‍ය සහක්‍රියාවන් සාක්ෂාත් කර ගැනීමට සහ කලාපයේ වර්ධන ක්‍රියාදාමය ඉදිරියට තල්ලු කිරීම සඳහා ඉන්දියා - ශ්‍රී ලංකා හවුල්කාරිත්වයේ කේන්ද්‍රීය තේමාව වන්නේ සම්බන්ධකතාවය යි. මෙහිදී අවධානය යොමු

වන්නේ ගුවන්, සමුද්‍රීය, වෙළඳ, ඩිජිටල්, බලශක්ති, ජනතාව අතර සබඳතා යන සියලු අංශයන්ගේ සම්බන්ධකතාවය ඉහළ නැංවීම යි.

පසුගිය මාස 6ක පමණ කාලය තුළ දෙරට මේ සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. කෙටි කාලයේදී ශ්‍රී ලංකාව සඳහා බලශක්ති සුරක්ෂිතතාවය සහතික කිරීම සහ දිගු කාලයේදී පිරිසිදු බලශක්තිය සඳහා අපනයන ධාරිතා ගොඩනැගීම අරමුණු කර ගත් විදුලිබල සම්බන්ධතාවයේ මූලික විධික්‍රම සම්බන්ධයෙන් මේ වන විට අවසන් අදියරට ළඟා වෙමින් පවතී. ගුවන් සහ සමුද්‍රීය සම්බන්ධකතාවය සඳහා මාර්ග සහ ලක්ෂ්‍යයන් එක් කර ඇත. වඩාත්ම අභිලාෂකාමී ව්‍යාපෘතිය වන ඉන්දියා - ශ්‍රී ලංකා භූමි සම්බන්ධකතා කොරිඩෝව විශාල වෙනසක් ගෙන එනු ලබන මෙම මුලපිරීම යථාර්ථයක් බවට පත්කිරීම සඳහා දෙපාර්ශ්වය විසින් ගනු ලබන පියවර සමඟින් ප්‍රගතිය කරා ගමන් කරමින් සිටියි.

ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ සහකරුවා, ආයෝජකයා සහ සංචාරක මූලාශ්‍රය වන අතර මෙම ක්ෂේත්‍රයන් තවදුරටත් පුළුල් කිරීමට කටයුතු කරමින් පවතී. ආර්ථික සහ තාක්ෂණ සහයෝගිතා ගිවිසුමක් සඳහා සාකච්ඡා ඉදිරියට යමින් තිබෙන අතර අවසාන සාකච්ඡා වටය ජූලි මාසයේ දී කොළඹ දී පැවැත්විණ. මූල්‍ය තාක්ෂණ ක්ෂේත්‍රය වර්ධනය කරමින් සහ ඉන්දීය සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ සංචාරය පහසු කරමින් UPI පදනම් කරගත් ගෙවීම් පද්ධතීන් මෙම වසර මුලදී ආරම්භ කරන ලදී.

දයාබර මිත්‍රවරුනි, ඉහතින් දැක්වූ ව්‍යාපෘතීන් ඉන්දියාව දේශීයව ඔප්පු කර පෙන්වූ හැකියාවන් සහිත ක්ෂේත්‍ර පමණි. අප අපගේ සාර්ථකත්වය සහ වර්ධනය වන සෞභාග්‍යය අපගේ සමීපතම ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයා වන ශ්‍රී ලංකාව සමඟ බෙදා හදා ගැනීමට අපේක්ෂා කරයි. අපට අවශ්‍ය වන්නේ ණය බර නොපටවා ශ්‍රී ලංකාවේ වර්ධනය සඳහා උපකාර කිරීමට යි. ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්වය සමස්ත ශ්‍රී ලංකාව සහ එහි සියලු ජනතාවට වර්ධනය සඳහා මාවතක් බවට පත් කිරීම අපගේ ප්‍රයත්නය යි.

පින්තූරයක් වචන දහසකට වඩා ශබ්දයෙන් කතා කරන බවට කියමනක් තිබේ. ඉන්දීය අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකා ජනාධිපතිතුමා අසලින්ම සිට සිය තෙවන ධුර කාලය සඳහා දිවුරුම් දීම ඉන්දියාවේ අසල්වැසියා ප්‍රථමයෙන් සහ SAGAR දැක්ම යළි තහවුරු කිරීමකි, අචල විශ්වාසය සහ හොඳ හිත මත පදනම්ව ඇති මෙම මිත්‍රත්වය ‘එක්ව සෞභාග්‍ය කරා’ පියනගන බෙදාහදා ගන්නා අනාගතයකට මං පෙත් විවර කරනු ඇති බවට ප්‍රතිඥාවකි.

ජයි හින්ද්.

ආයුබෝවන්, වණක්කම්, ධන්‍යවාද්.